# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024**

**2026 ජූලි / අගෝස්තු**

**මානවශාස්ත්‍ර පීඨය**

## ප්‍රතිබිම්බ කලාව

**ප්‍රතිබිම්බ කලාව පිළිබඳ හැඳින්වීම IMAT 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

1. කලාව යනු කුමක්දැයි නිර්වචනය කර, අනෙකුත් කලා මාධ්‍යයන් අතරින් ප්‍රතිබිම්බ කලාව සතු සුවිශේෂ ලක්ෂණ සහ වෙනස්කම් පැහැදිලි කරන්න.

2. දෘශ්‍ය කලාවේ මූලිකාංග වන රේඛාව (Line) වර්ණය (Color) සහ හැඩය (Shape) වැනි සාධක ඡායාරූප නිර්මාණකරණයකදී නිර්මාණාත්මක පදනමක් ලෙස භාවිත වන අයුරු විස්තර කරන්න.

3. "කැමරාව නිර්මාණය කර ඇත්තේ මිනිස් ඇසෙහි ස්වභාවය ගුරුකොට ගනිමිනි." මෙම ප්‍රකාශය රූප සටහන් ඇසුරින් විස්තර කරන්න.

4. ඒකකාච ප්‍රතිඡායා කැමරාවක (SLR) මූලික ව්‍යුහය හඳුන්වා දී, එය අංකිත ඒකකාච ප්‍රතිඡායා (DSLR) කැමරාවකින් වෙනස් වන තාක්ෂණික කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

5. නිවැරදි ඡායාරූපයක් සටහන් කර ගැනීමේදී අනුගමනය කළ යුතු මූලික පියවර වන මානනය (Aiming) නාභිගත කිරීම (Focusing) සහ අනාවරණය (Exposure) යන සංකල්ප උදාහරණ සහිතව විමර්ශනය කරන්න.

6. කැමරා කාච (Lenses) යනු මොනවාදැයි හඳුන්වා, නිර්මාණාත්මක ඡායාරූපකරණය සඳහා විවිධ කාච වර්ග භාවිත කිරීමේ වැදගත්කම විස්තර කරන්න.

7. ස්වාභාවික සහ කෘත්‍රිම ආලෝක ප්‍රභවයන් වෙන් වෙන්ව හඳුන්වා, ඡායාරූපකරණයේදී කෘත්‍රිම ආලෝකය (Artificial Light) නිර්මාණාත්මකව භාවිත කරන්නේ කෙසේදැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

8. පික්සලය (Pixel) යනු කුමක්දැයි හඳුන්වා, අංකිත (Digital) ඡායාරූපයක ගුණාත්මකභාවය කෙරෙහි එහි බලපෑම විස්තර කර, ඡායාරූප ගබඩා කිරීමේ මාධ්‍ය (Memory Cards) පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

9. පහත සඳහන් මාතෘකා දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.
    - I. ක්ෂේත්‍ර ගැඹුර (Depth of Field)
    - II. විද්‍යුත් ක්ෂණිකාලෝකය (Flash)
    - III. විවිධ පෙරන (Filters)
    - IV. අධිඅනාවරණය (Over exposure)

*************************